# මලීගේ සුදු බෝලේ



යසාරා කුමාරි අත්තනායක

# මලීගේ
# ක්ෂුද්‍ර බෝලේ

“මලීගේ සුදු බෝලේ”

යසාරා කුමාරී අත්තනායක

2 ශ්‍රේණිය D

මහ/මහාමායා බාලිකා විද්‍යාලය

කෘතිය පළකරන දිනය - 2025/02/08

**ISBN No :- 978-624-208-556-2**

# පිදුම

මෙම පොත් පිංච

නිර්මාණය කිරීමට

මා පෙළඹවූ මාගේ මුල් ගරුතුමිය

ඇතුළු ගුරු මෑණිවරුන්ටත්,

දයාබර දෙමාපිය දෙපලටත්, අක්කාටත්

සෙනෙහසින් පුදමි.

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනිනුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදිණි යුග කැපී පෙනෙන්නේ සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය.එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධියෙහි මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර න්න මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවරක් පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථ දස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස යතිවර ලේඛන සම්ප්‍රදාය  රට තුළ ගොඩනඟන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන්වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි.ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාවය හඳුනා ගනිමින් ලේඛනකරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,
ශෂිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය,

මහනුවර.

එකමත් එක ගමක හිටියා ලස්සන,දඟකාර,අහිංසක ගැහැණු ළමයෙක්. මලී හරිම හුරතල්.



මලීට ඉන්නේ අම්මයි, තාත්තයි, මල්ලියි. මලීගේ සුරතලා පූස් පැටියෙක්. පූස් පැටියා සුදුම සුදුයි.



මලී සුදු බෝලේට හරිම ආදරෙයි. මලී නිතරම පූසා එක්ක සෙල්ලම් කරනවා. මලී ළඟ සුදු බෝලේ පුරුෑ පුරුෑ ගානවා.



දවසක් මලීගේ පූස් පැටියා පේන්න හිටියේ නෑ. මලී හොඳටම ඇඬුවා. පූසාව හැම තැනම හෙව්වා. මලී කෑම කෑවෙත් නෑ. මලීගේ පවුලේ අයත් පූසාව හෙව්වා.



# මලී වත්ත පහළට දිවුවා. ගසක් යට පූස් පැටියා වැටිලා ඉන්නවා දැක්කා.



පූස් පැටියා මලානික වෙලා. මලී පූස් පැටියා වඩාගෙන ගෙදර දිව්වා. වතුර පෙව්වා. පූස් පැටියා ඇස් ඇරියා.



මලීට හරිම සතුටුයි.

මලී පූසාට කෑම දුන්නා. ආදරෙන්

හුරතල් කළා.



මලී මල්ලිට සතුන්ට කරුණාව

ආදරය කරන හැටි කියා දුන්නා.

මල්ලී ආදරෙන් අහගෙන

හිටියා. පූස් පැටියා හුරතල්

කළා. සුදු බෝලේ පුරු පුරු

ගෑවා.



මලීට දවසක් ලොකු අත්තා

කිව්ව කථාවක් මතක් වුණා. “

දුවේ.. අපි සතුන්ට ආදරය

කරමු. කරුණාව දක්වමු.”



මම සතුන්ට කරුණාව දක්වන හොඳ ළමයෙක් මලීට හිතුණා.





පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයක් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය යක් නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිවෙයි 2014 වර්ෂයේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.

එම බීජ දළුලා වැඩෙන්නට ඇවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනය ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප,පළාත්,ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවරක් ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායාක් ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමියක් ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන්ක් ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරු බව තුන්ක් ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරු බව තුන් දෙමාපියන් සහක් ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය දියණියන් ගුරු බව තුන් දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූක් ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරු බව තුන් දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීම සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරු බව තුන් දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීම ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන් කිසිවකින් ලබාදිය නොහැකියාව මානව දැනුම ගබඩා කරන්න තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනවිරත්න මහලේකම්.